# දේව මාතාවන්ගේ
## නිර්මල හෘදයට ගෞරව කිරීම සඳහා



# නිරන්තර භක්ති නුවානය

# සූදානම

## (ශුද්ධාත්මයාණන් වහන්සේට ගීතිකා)

## 1. දෙවන් පහන් මිණි නගා

දෙවන් පහන් මිණි නගා - වඩිනු සුදතුණේ
හද පුරා වගුරුවා කිඳුරස් ඔබගේ

අසරණුන් පියේ - වඩිනු වරම් දෙන පියේ
හිතට එළිය ඔබ අනේ වඩිනු අප සොයා

## 2. ශුද්ධාත්මෙනී ශුද්ධාත්මෙනී

ශුද්ධාත්මෙනී // වඩින් ශුද්ධාත්මෙනී
මා ජීවිතේ ආලෝකෙනී වඩීන් ශුද්ධාත්මෙනී

ඔබේ වරම් මගේ හදේ මවා ශුද්ධාත්මෙනී
මා ජීවිතේ ආලෝකවත් කරන්න ස්වාමිනී

දැවී දැවී සිලෙන් ගිනි රනින් ඔපේ නැගේ
ඔබේ පෙමින් එසේ අපත් දවන්න ස්වාමිනී

# ශුද්ධවූ ජපමාලයේ අභිරහස් භාවනාව

## සොම්නස් අභිරහස්

( සඳුදා සහ බ්‍රහස්පතින්දා, ආගමනයේ සිට

චතාරිකය දක්වා ඉරුදිනයන්හිදී)

1. ගාබ්‍රියෙල් දේව දූතයා මරියතුමීයට මංගලම් කීම සහ දේව පුත්‍රයාණන්ගේ මාංශගතවීම.
2. මරියතුමිය එළිසබෙත් තුමිය බැහැදැකීමට යාම ජේසු කුමරාණන් සහ ජුවාම් කුමරාණන් මව් කුස තුළදීම හමුවීම.
3. ජේසු බිළිදාණන් දිළිඳු වෙසින් මෙලොවට බිහිවිම. ගැළැවීමේ සුභාරංචිය ලොවට අනාවරණය වීම.
4. ජේසු බිළිඳා දේව මන්දිරයේදී ඔප්පු කරනු ලැබීම දැහැමි සිමියොන් තුමන්ගේ දිවැසි වැකිය.
5. ජේසු කුමරා සේව මන්දිරයේදී නැතිවී තුන් දිනකට පසු නැවත සම්බ වීම.

# දෙම්නස් අභිරහස්

( අඟහරුවාදා, සිකුරාදා සහ චාතාරිකයේ
ඉරුදිනවල ද අළු බදාදා සිට පාස්කු දක්වා
සෑම දිනවලම )

1. ජේසුස් වහන්සේ ගෙත්සෙමෙන් මල් උයනේ යාච්ඤා කිරීම සහ ඔවුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය.

2. ජේසුස් වහන්සේ ගල්කණුවේ බඳිනු ලැබ දරුණු ලෙස කස පහරවලින් තලනු ලැබීම.

3. ජේසුස් වහන්සේට කටු ඔටුන්නක් පළඳවනු ලැබ නින්දා අපහාස කරනු ලැබීම.

4. ජේසුස් වහන්සේ අති බරවූ කුරුසියක් කර තබාගෙන කල්වාරියට නැගීම.

5. ජේසුස් වහන්සේ අවසාන ලේ බිංදුව දක්වා හෙළමින් කුරුසියෙහි උකුත් වීම.

# මෝක්ෂ අභිරහස්

( බදාදා සෙනසුරාදා සහ උත්ථානයෙන් පසු

ආගමනය දක්වා ඉරුදිනවල )

1. ජේසුස් වහන්සේ උකුත් වී තුන් දිනකට පසු මළවුන් කෙරෙන් උත්ථාන වීම.
2. උත්ථාන වූ ස්වාමීන් වහන්සේගේ ප්‍රතාපවත් ස්වර්ගාරෝහණය.
3. දෙව්මවුන් සහ ගෝලයන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ ගිනි දිව් අකාරයෙන් වැඩම කිරිම.
4. අති පිරිසිදු කන්‍යා මරිය මතාවන් වහන්සේ ආත්ම ශාරීරාකාරයෙන් ස්වර්ගයට ඔසවනු ලැබීම.
5. දේව මාතාවන් ත්‍රිලෝක රාජිණිය වශයෙන් ඔටුණු පළඳවනු ලැබීම.

## සෑම පන්තියකට පසු මෙසේ කියන්න.

" අහෝ මාගේ ජේසුනි, අපේ පාපවලට සමාව දුන මැනව. නිරා ගින්නෙන් අප ගළවා ගත මැනව. සියලු අත්මයන් ද, විශේෂ කොට ඔබගේ දයාව ඉතා උවමනා ආත්මයන් ද, ස්වර්ග රාජ්‍යයට ගෙන්වා ගත මැනව.

**මූලිකයා** : *ජම්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳුණාවූ මරියනී,*

**සියල්ලෝ** : ඔබ වහන්සේගේ පිහිට උපකාර ඉල්ලා සිටින්නා වූ අප උදෙසා යාච්ඤා කළ මැනව.

**මූ** : *සියලු වරප්‍රසාදයේ මැදහත්කාරිය වූ මරියනී,*

**සි** : අප නිසා යාච්ඤා කළ මැනව.

**සි** : ශුද්ධාත්මයාණෙනි, වැඩම කළ මැනව. ඔබවහන්සේගේ ප්‍රිය කාන්තාව වූ මරිය වහන්සේගේ නිර්මල හෘදයේ බලවත් මැදහත්කම කරණකොටගෙන වැඩිය මැනව.

**නමෝ - නමෝ නමෝ මරියේ //**

## ජපමාලය ඔප්පු කිරීම

සකළ ගුණ සම්පන්න වූ කරුණාභරිත වූ දේව මාතාවෙනී, ඔබවහන්සේගේ ශ්‍රී පාද පද්මයට වැඳ නමස්කාර කර මේ ජපමාල ධ්‍යානය ඔබවහන්සේට කියා ඔප්පු කර සිටිමු.

මෙහිදී අප විභාග කළ කාරණාවල් අපට සිද්ධ කොට දී මෙලොවින් අප මිදී ගිය කල්හි ඔබ හා ඔබගේ ශ්‍රී කුමාරයාණන් දැක මෝක්ෂ සම්පත් ලබන සැටියට කරුණාකර වදාළ මැනව. ආමෙන්.

## මංගල ආරාධනාව

මංගල්‍යස්තු රාජේස්වරියනි, කෘපදයා මාතාවෙනි. අපේ ජීවිතයෙනි, අපේ අමෘතයෙනි, අපේ ආධාරයෙනි, මංගල්‍යස්තු, පරදේසවාසී වූ අපි ඒව අම්මාගේ පුත්‍රයෝ ඔබටම අඬගසම්හ. මේ කඳුළු විලෙහි අඬා වැළපී ඔබටම සුසුම්ලම්හ. එසේ හෙයින් අපගේ මධ්‍යස්ථයෙනි මේ ඔබගේ දයාබර නේත්‍රවල් අප දෙස යොමු කළ මැනව. තවද පරදේශය පසුවූ ඉක්බිති ඔබගේ ශ්‍රී කුසෙහි ආශිර්වාදලත් ඵලවන් ජේසුතුමන්ගේ දර්ශනය අපට ලබා දුන මැනව. දයාවන්තියෙනි, පරදුක්ඛ දුක්ඛිතිනි, මධුරවූ නිත්‍යා කන්‍ය මරියනි, සාන්ත වූ දේව මෑණියෙනි, ක්‍රිස්තු තුමන්ගේ වාක්දාත වලට අප හේතුවන්ත වන පිණිස. කන්‍යා ශුද්ධවූ දේව මාතාවෙනි අප නිසා යාච්ඤා කළ මැනව.

# අති නිර්මල හෘදයට ප්‍රතිකාර ප්‍රාර්ථනාව

අති නිර්මල කන්‍යා මාතාවෙනි, පරිශුද්ධ ත්‍රිත්වයේ ඒකානන්දයෙනි, දේව දූත නව පන්තීන් ගේ මුදුන් මල්කඩෙනි, ශුද්ධවර සියල්ලන්ගේ මහිමයෙනි, පව්කාර අපගේ කුළුණුබර මාතාවෙනි, අඥානයන් ද ගුණමකුවන් හා දුෂ්ටයන් ද, ඔබට විරුද්ධව කියන කරන භායානක දුෂ්කෘත හා සාහසික අපරාධයන් එකක් එකක් පාසා ඔබගේ අති පෙම්බර හෘදයට වන්දි ගෙවීමේ ආශාවෙන් අපි ඔබ ඉදිරියේ ශෂ්ඨාංගයෙන් වැඳ වැටී සිටිමු. ශු.ත්‍රිත්වයේ තුන්දෙනා වහන්සේලා ද සුරලොව නරලොව සුසිත් ජනයන් හා මුළු මැවිල්ල ද, ඔබට පෙන්වන ආදර ගෞරවය ට එක්කොට, අප ඔබට ඔප්පු කරන මේ ප්‍රතිකාරය දයායෙන් පිළිගත මැනව.

1. ඔබ වහන්සේගේ ජම්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳීම ගැන කරන අපහාසයන් උදෙසා,

2. මරිය යන ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට කරන අවමාන්න උදෙසා,

3. ඔබ වහන්සේගේ සුපිරිශුඬ ජීවිතය ගැන කරන අගෞරවයන් උදෙසා,

4. ඔබ වහන්සේගේ කන්‍යවෘත භාවයට කරන නිග්‍රහයන් උදෙසා,

5. ඔබ වහන්සේගේ කන්‍යාවෘත පවුල් ජීවිතයට, කරන නින්දිතකම් උදෙසා,

6. ඔබ වහන්සේගේ කෞමාර මාතෘත්වයට කරන සමච්චල් උදෙසා,

7. ඔබ වහන්සේගේ කුළුණුබර දයාවට කරන ගුණ මකුකම් උදෙසා,

8. ඔබ වහන්සේගේ පරම බලයට කරන බැණුම් උදෙසා,

9. ඔබ වහන්සේගේ ප්‍රතිමා තින්තුර යනාදියට කරන දුෂ්කෘතයන් උදෙසා,

මෑණියනී, අපි ඔබ වහන්සේට සැනසීම දෙමු.

10. ඔබ වහන්සේගේ දේවස්ථානය තුළ කරන දේව දූෂණ ක්‍රියාවල් උදෙසා,

11. ඔබ වහන්සේගේ කැපවූවන් පවා ඔබ වහන්සේට පෙන්වන නොසැළකිලිකම් උදෙසා,

12. ප්‍රසිද්ධියෙන් හා අප්‍රසිද්ධියෙන් ඔබ වහන්සේට කරන සෑම අපහාසයන් උදෙසා,

13. ඔබ වහන්සේගේ අති ශෝක හරිත කඳුළු උදෙසා,

14. ඔබ වහන්සේගේ කඨුරතර වික්ෂෝපයන් උදෙසා,

15. කඩු පහරින් සිදුරුවූ ඔබ වහන්සේගේ අති නිර්මල හෘදය උදෙසා,

## යාච්ඤා කරම්හ

කටුවලින් සිදුරුවූ ඔබගේ නිර්මල හෘදය කුඩා දරුවන්ට පෙන්වා සැලසීම ඉල්ලා සිටි අප අති පෙම්බර මාතාවෙනි, අප ඔබට ඔප්පු කරන මේ සුළු සැනසීම දයාවෙන් පිළිගත මැනව. මින් මත්තට අප මුළු ජීවිතය ඔබට ප්‍රතිකාර කිරීමේ ක්‍රියාවකට හරවාගෙන, ඔබ නිසා පමණක් ජීවත් වීමට අපට සැලසුව මැනව. '' අපගේ ජීවිතය '' වන මධුරතර මාතාවෙනි, පණටත් වඩා ඔබට ප්‍රේම කරමින් ඔබ නිසාම ජීවත්වී, ඔබ නිසාම අප ප්‍රාණය පූජා කිරීම දේව කැමැත්ත වේ නම් ඊට අප සූදානම් කළ මැනව. නොඑසේ නම් පෙම්බර මාතාවෙනි, එක එක මොහොතක් පාසා ඔබ නිසාම ජීවත්වී, ඔබ කෙරෙහි ප්‍රේමයෙන්, නැසී ගොස් ඔබ තුරුල්ලෙහි සදාකාල දේව ගී ගයන්නට අප කැඳවා ගත මැනව. ආමෙන්.

## අති නිර්මල හෘදයට ප්‍රතිකාර යාච්ඤාව

අප පෙම්බර මාතාවන/ පරිශුද්ධ කන්‍යාවෙනි, ගුණමකු මනුෂ්‍යයන්ගේ/ දේව දූෂණ බැණුම් හා/ කෙලෙහිගුණ නැතිකම් නමැති කටුවලින් නිතර සිදුරු කරනු ලබන්නාවූ/ ඔබගේ නිර්මල හෘදයෙන්/ පිටවූ

මැසිවිලි ශබ්දය අසා/ මහත් ශෝකයට/අපි පත්වී සිටිමු. මවකට මෙන් ඔබට ප්‍රේම කරමින්/ ඔබගේ නිර්මල හෘදය කෙරෙහි භක්තිය/ වඩ වඩා දියුණු කිරිමේ ආශාවෙන්/ දැවෙන්නාවූ අපි/ මනුෂ්‍යයන්ගෙන් ඔබට ලැබෙන සෑම අවමාන්න වලට/ වන්දි ගෙවිමේ දැඩි ආශාවෙන්/ ඔබ පාමුල වැඳ වැටී සිටිමු. මින් මත්තට අපේ යාච්ඤා වලින් හා/ මර්දන ක්‍රියා මගින්/ ඔබගේ අති මෘදු හෘදය/ සැනසීමට පොරොන්දු වෙමු.

අපට ද/ සියලු පව්කාරයන්ට ද/ දයාබර මාතාවෙනි, සමාව ලබා දුන මැනව. අපට උවමනා/ සියලු වරප්‍රසාද ලබා ගැනිමට/ ඔබගේ එකම වචනයක්/ ප්‍රමාණ වන්නේ ය.

අහෝ වික්ෂෝප මාතාවෙනි/ මෙතරම් සිත් රිදවනු ලබන/ දෙවියන් වහන්සේ වඩ වඩා පව්කරුවන් විසින් රිදවනු ලැබ/ ඔවුන් නිරා ගින්නට පත් නොවෙන පිණිස/ ඔවුන්ගේ සිත් හැරි/ ස්වකීය දෙව් පියාණන් වෙත හැරී ඒම/ ඉක්මන් කළ මැනව. මෙලොවෙහිදී/ අප මුලු හෘදයෙන්/ දෙවියන් වහන්සේට ප්‍රේම කොට/ පරලොවේදී/ සදාතන සැප භුක්ති විඳිනු පිණිස/ ඔබගේ දයාබර නේත්‍රයන්/ අප දෙස යොමු කළ මැනව.

# අපි ශුද්ධෝත්තම පියතුමා උදෙසා යාච්ඤා කරමු

සකල විශ්වාසකයන්ගේ/ එඬේරාණන් ද/ ආණ්ඩුකාරයාණන් වූ දෙවියනි! / ඔබ වහන්සේ ගේ සභාවේ/ ශ්‍රේෂ්ඨ එඬේරාණන් කොට/ පත්කර සිටින/ .... නමැති ඔබගේ දාසයාට දේව ආරක්ෂාවත්/ ශක්තියත්, දේවාශීර්වාදයත්/ දානය කරමින්/ සතුරන්ගේ දුෂ්ට අදහස් වලට එතුමන් ගොදුරු වීමට ඉඩ නොදී ආරක්ෂා කරගත මැනව.

එතුමන්ගේ/ වචනයෙන් හා ක්‍රියාවෙන්, එතුමන් යටතේ සිටින/ සියල්ලන් දියුණු කර, තමන්ට භාරකර සිටින/ රැළත් සමග/ අනන්ත ජීවිතයට පැමිණෙන්ට එතුමන් වෙත කරුණා කර වදාළ මැනව. ආමෙන්.

ස්වර්ගයේ වැඩ සිටින .......

නමෝ මරියනී .......

පිතා පුත්‍රයා ස්ප්‍රීතු .......

# විප්ලවයෙන් ආරක්ෂා වන පිරිස කළ යුතු යාච්ඤා

කොමියුනිස්ට් ධර්මයෙන් මඟ හැරී යන්නට නම් මරිය වහන්සේගේ නිර්මල හෘදයට අප කැපවන ලෙස පාතිමාවේදී භාග්‍යවන්ත කන්‍යාව ප්‍රකාශ කළා ය. මෑතකදී ඇතිවී තිබෙන විප්ලව, විශාල දඬුවම් ළඟාවන බව නැවත නැවත කියා දෙන්නේ ය. එහෙත් මරියතුමියගේ නිර්මල හෘදයට කැපවූ ගෘහයන් පමණක් ආරක්ෂා වන බව කියා තිබේ. පාතිමා දර්ශනය දුටු ලුසී කියන පරිදි සෑම දෙනා විසින් දුඹුරු වර්ණයෙන් හෝ කලු වර්ණයෙන් හෝ යුත් බෙන්තිඤ්ඤය පැළඳිය යුතුය. '' බෙන්තිඤ්ඤයෙන් හා ජපමාලයෙන් ලෝකයාගේ ගැළවීම උදාවන දවසක් එන බව ශු.දොමිනික් තුමා වරක් ප්‍රකාශ කොට තිබේ ''

## යාච්ඤාව

### මාගේ ගෘහය මම කැප කරමි.

දුකින් හරිත වූ ද, නිර්මල වූ ද හෘදයක් ඇති අති භාග්‍යවන්ත කන්‍යාවෙනි, මේ ගෘහයේ ස්වාමිදුව හා රැජින වශයෙන් අපි ඔබව හඳුනා ගනිමු.

ගින්නෙන්, ජළයෙන්, ගිගුරුම්, කුණාටු භූමිකම්පා, සොරුන්, අධර්මිෂ්ඨයන්, විප්ලවයන්, යුද්ධ, ගුවන් පහර, පීඩන, බදු බර යනාදියෙන් හා ඔබ දන්නා වෙනත් සෑම උවඳුරු වලින් අපව රැක ගැනීමට කරුණා කළ මැනව.

මෙහි සිටින්නාවුන් හා සිටින්නට යන අය ද ඔබගේ පෞද්ගලික වස්තුවක් මෙන් ආශිර්වාද කර, ආරක්ෂා කර, රැකවල් කර, ප්‍රවේශම් කළ මැනව. විපත් වලින් හා අවාසනාවන්තකමින් ඔවුන් වැලැක් වුව මැනව. මේ සියල්ලට වඩා දෙවි සමිඳුන්ට ඔවුන්ගෙන් වරදක් නොවන පිණිස ප්‍රවේශම් කළ මැනව. කිසි කළෙක මේ ගෘහය තුළ කිසිම මාරක පාපයක් සිදු නොවේවා! තවද මෙහි ප්‍රවේශ වන සියල්ලෝ දෙවියන්ගේ මහිමය සඳහා ද ජේසු සමිඳුන්ගේ හා මරිය වහන්සේගේ රජකම සඳහා ද, ක්‍රියා කරත්වා. අහෝ ජේසුනී, මරියනි! ඔබ වහන්සේලාට සදහටම මෙම ගෘහය කැපවේවා. එහි වෙසෙන සියල්ලන් සමඟ එයට ආශිර්වාද ලැබේවා ආමෙන්.

# පෞද්ගලික කැප කිරීමේ යාච්ඤාව

අහෝ නිර්මල මරියතුමියගේ හෘදයෙනි, ස්වර්ගයේත්, පෘථිවියේත් රාජනියෙනි, මනුෂ්‍යයන්ගේ දයාවන්ත මාතාවෙනි, පාතිමාවේදී දක්වන ලද ඔබගේ ජ්වලිත කැමැත්ත පරිදි මමත්, මාගේ පවුලත්, මාගේ ගෘහයත්, මාගේ නගරයත්, මාගේ රටත් සහ සමස්ත මනුෂ්‍ය ජාතියත් ඔබ වහන්සේට කැප කරමි. මෑණියනි, ජේසු සමිඳුන්ගේ හෘදය ඔබ තුළ රජකම් කොට ජයගත් පරිද්දෙන් ඔබ වහන්සේ අප තුළ රජකම් කොට ජේසු සමිඳුන්ගේ දිව්‍ය හෘදය අප තුළ රජකම් කරවා ජයග්‍රහණය කරවන ආකාරය ගැන උගන්නුව මැනව. ස්නේහ හරිත මාතාවෙනි, සැපතේදිත්, විපතේදීත්, දුකේදීත්, ප්‍රීතියේදීත්, සුවයේදීත්, රෝගයේදීත්, ජීවිතයේදීත්, මරණයේදීත් අප ඔබ වහන්සේට අයිතිවනු පිණිස අප මත රජකම් කළ මැනව.

අහෝ අනුකම්පා හරිත මරියතුමියගේ හෘදයෙනි කන්‍යාවන්ගේ රැජිණියෙනී, අපගේ සිත් සතන් රැක බලා පාතිමාවේ දී ඔබ වහන්සේ බොහෝ ලෙස කණගාටු වූ අශුද්ධාතාව නමැති ජල ධාරාවෙන් ඔවුන් ප්‍රවේශම් කළ මැනව. ඔබ සේ නිර්මල වීමට

අපද ආසා වන්නෙමු. ජේසු සමිඳුන්ටත්, ඔබ වහන්සේටත්විරුද්ධව කරන ලද බොහෝ අපරාධ නිසා වන්දි ගෙවීමට අපි කැමැත්තෙමු. යුක්තිය තුළින් හා දේව ප්‍රේමය තුළින් දේව සමාදානය අප රටටත්, සමස්ත ලෝකයාටත් අයදැ සිටිමට කැමැත්තෙමු.ඒ හෙයින් මානුෂික ගෞරවයක් නොතකා ක්‍රිස්තියානි ජීවිතයක් අභ්‍යාස කරමින් ඔබගේ ගුණ ධර්ම අනුසාර කිරීමට අපි දැන් පොරොන්දු වෙමු. සෑම මාසයකම පළමු වෙනි සෙනසුරාදා ශුද්ධවූ සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනිමටත් දවස් පතා ජපමාලයෙන් පංති පහක් ඔබට කිරිමටත් ඒ සමග අපි පරිත්‍යාගයන් වන්දි ගෙවීමේ හා පසුතැවිලි ක්‍රියා ලීලාවෙන් ඔප්පු කිරිමටත් අධිෂ්ඨානය කර ගනිමු.

# ඉල්ලීම් හා ස්තුති කිරීම්

## සුළු දේශනය

### දේව මාතාවන්ගේ නිර්මල හෘදය සඳහා නොවාන යාච්ඤාව

අහෝ මරියනී, ජපමාලයේ අප ස්වාමිදුවෙනි, ඔබ ඉදිරියෙහි බැගෑපත්ව වැඳ වැටී සිටින අප අද දින අපගේ ආදර ගෞරවය ද භක්ති ප්‍රේමය ද ඔබට පුද කරමින්, අප ද, අප සතු සියල්ලද ඔබට කැප කරමු.

අහෝ නිර්මල හෘදයේ මරියනී, මනුෂ්‍ය ජාතීන්ගේ සරණයෙනි, ඔබගේ බලසම්පන්න මැදහත් භාවය සිහිපත් කරමින් මනුෂ්‍ය වර්ගයේ ඉතාමත් අනතුරුදායක මේ මොහොතේදී ඔබගේ මාතෘක රැකවරණය කරා නොබියව දුව එන්නෙමු. මනුෂ්‍යයන්ගේ හදවත් හි ඇත්තාවූ ක්‍රිස්තු ප්‍රේමය සහ ක්‍රිසතු ප්‍රතිපත්ති විනාශ කර දමන සියලු අදේව වාදී ධර්මයන්ගෙන් අප රැක ගත මැනව. ලොව සෑම තැනම අසහනය සහ බිය පවතින මේ කාලයේදී සාමය සහා සමාදානය අප හෘදයන්ටත් අප නිවෙස් වලටත් අප රටටත් දානය කළ මැනව.

තවද අද දින මේ නොවානය පවත්වන වේලේදී ඔබ වහන්සේගෙන් අප අයැද සිටින ඉල්ලීම් වෙත ද ඔබගේ කරුණාව යොමු කළ මැනව.

**( නිශ්ශබ්දව ඔබ ඉල්ලීම් නම් කරන්න )**

අප පෙම්බර මව්නි ඔබ මෙන් පිරිසිදුව ද බැගෑපත්ව ද ඉවසිලිමත්ව ද සහෝදර දයාවෙන් යුක්තව ද ජීවත් වීමට අපට පිහිට ආශිර්වාද දුන මැනව. ඔබ තුමිය විසින් පාතිමාවේ දී කන්නලව්වෙන් කළාවූ යාච්ඤා සහ පරිත්‍යාගි ක්‍රියා නොකඩවා කරගෙන යාමට අපට පිහිට වුව මැනව.

අහෝ නිර්මල මැණියෙනී ජේසු සමිඳුන්ගේ දිව්‍ය හෘදයට ද ඔබගේ නිර්මල හෘදයට ද අප ලංකර ගෙන ස්වර්ගයේ දී සදා ඔබ වහන්සේලාට තුති කිරිමටත් භක්ති ආදරය දැක්වීමටත් අපට වරම් දුන මැනව.

ආමෙන්.

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරිපිට දණින් වැටී කිවයුතු යාච්ඤා

- මාගේ දෙවියනි/ අපි ඔබ වහන්සේ කෙරෙහි/ විශ්වාස කරමු./ අපගේ විශ්වාසය/ වැඩි කර වදාළ මැනව.

- මාගේ දෙවියනි/ අපි ඔබ වහන්සේට/ වන්දනා නමස්කාර කරමු./ අපගේ වන්දනා නමස්කාරයට/ අනුබල දී වදාළ මැනව.

- මාගේ දෙවියනි/ අපි ඔබ වහන්සේ කෙරෙහි/ බලාපොරොත්තු වෙමු./ අපගේ බලාපොරොත්තුව/ වැඩි කර වදාළ මැනව.

- මාගේ දෙවියනි/ අපි ඔබ වහන්සේට / ප්‍රේම කරමු./ අපගේ ප්‍රේමය/ වැඩි කර වදාළ මැනව.

- ජේසුනි/ ඔබ වහන්සේ කෙරෙහි/ විශ්වාස නොකරන්නන් උදෙසා/ අපි ඔබ වහන්සේගෙන්/ සමාව ඉල්ලමු.

- ජේසුනි/ ඔබ වහන්සේ කෙරෙහි/ බලාපොරොත්තු නොවන්නන් උදෙසා/ අපි ඔබ වහන්සේගෙන්/ සමාව ඉල්ලමු.

- ජේසුනි/ ඔබ වහන්සේ කෙරෙහි/ බලාපොරොත්තු නොවන්නන් උදෙසා/ අපි ඔබ වහන්සේගෙන්/ සමාව ඉල්ලමු.

- ජේසුනි/ ඔබ වහන්සේට/ ප්‍රේම නොකරන්නන් උදෙසා/ අපි ඔබ වහන්සේගෙන්/ සමාව ඉල්ලමු.

- ස්වාමීනි/ අපගේ පාපවලට/ සමාව දුන මැනව.

- ස්වාමිනි/ ඔබ වහන්සේගේ සෙනඟ/ ඔබ වහන්සේගේ සදා උදහසින්/ බේරා ගත මැනව.

- ජේසුනි/ අප විනාශ වන්නෝ ය./ අප ගළවා ගත මැනව.

- මාගේ දෙවියනි/ අපගේ සහයට/ ඔබ වහන්සේගේ ආධාරය කඩිනම් කළ මැනව.

- පීඩිත වූවන්ගේ ස්වාමීනි/ අපට පිහිට වුව මැනවි.

- මරියතුමියගේ නිර්මල හෘදයෙනි/ අපගේ ගැළවීම වුව මැනව.

- එකිනෙකාට ප්‍රේම කිරීමට/ අපට ඉගැන්වුව මැනව.

- අපගේ පවුල් ජීවිත/ ශුද්ධවන්ත කළ මැනව.

- දයාවේ වරප්‍රසාදය/ අපට ලබා දුන මැනව.

- යුක්තියේ වරප්‍රසාදය/ අපට ලබා දුන මැනව.

- පිරිසිදුකමේ වරප්‍රසාදය/ අපට ලබා දුන මැනව.

- ලෝක රැජිණියනි/ ලොවට සාමය දුන මැනව.

- ශ්‍රී ලංකාවේ අප ස්වාමිදුවෙනී/ සියලු විපතින් අප දේශය රැකගත මැනව.

- ජම්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳු මෑණියනී/ ඔබගේ සරණය සොයා එන/ අප නිසා යාච්ඤා කළ මැනව.

- අපගේ ගැළවීම සඳහා/ ඔබව අපගේ මව කලාවූ එතුමන් ඉදිරියේ/ අප නිසා මැදහත් වුව මැනව.

- අහෝ මරියනි/ පීඩිතවුවන්ගේ සැනසිල්ලෙනි/ අප නිසා යාච්ඤා කළ මැනව.

- පව්කාරයන්ගේ සරණයෙනි/ අප නිසා යාච්ඤා කළ මැනව.

- පාතිමාවේ ජපමාල අප ස්වාමිදුවෙනි/ දේව ප්‍රේමය සඳහාත්/ ශුද්ධවූ ත්‍රිත්වයේ මහිමය සඳහාත්/ අපට උවමනා වරප්‍රසාදයන්/ ලබා දුන මැනව.

පිතා පුත්‍රයා ස්ප්‍රීතු සාන්තු වන/ අති පරිශුඬ ත්‍රිත්වයෙනි/ ඔබ වහන්සේට/ අපි ඉතා බැගෑපත් ලෙස/ වන්දනා නමස්කාර කරමින්/ ඔබ වහන්සේට ද/ අප ස්වාමිවූ/ ජේසු ක්‍රිස්තුන් වහන්සේට ද/ විරුද්ධව කෙරෙන පාප අපරාධවලට/ ප්‍රතිකාර වශයෙන් මෙම දිව්‍ය සත්ප්‍රසාද මංඩපයෙහි ද/ මුළු ලෝකයේ සෑම දිව්‍ය සත්ප්‍රසාද මංඩපයන්හි ද/ වැඩ සිටින/ එතුමාණන්ගේ/ අති අමිල වූ ශරීරය හා/ රුධිරය ද/ ආත්මය හා/ දෙව්කය ද/ ඔබට ඔප්පු කරමු.

එතුමාණන්ගේ දිව්‍ය හෘදයේ/ අනන්ත කුසල් පල සහ/ මරියතුමියගේ නිර්මල හෘදයේ යාච්ඤා කන්නලව් උදෙසා/ පව්කාරයන්ගේ සිත් හැරීම/ අපි ඉතා බැගෑපත් ලෙස/ ඉල්ලා සිටිමු.

# දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය

ආ උතුම් මේ අභිරහස දෝත් මුදුන් දී වඳිමු
බැහැර වේ පුරාණ තේවා - දැන් පිදේ පිදුම් අමා
දුබල වූ ඉඳුරන්ට - පිහිට වේ විශ්වාසය

දෙව්පියාට දෙව්පුතුන්ට වේ පසස් මඟුල් ගොසා
වන්දනා ගරු විකුම්ද ආසිරි සිරිත් වේවා!
මේ තුමන් කෙරෙන් නිකුත් වු සා වැනුම් සුදාත්මටා

**පූජාප්‍රසාදිතුමා** : ඔවුන් වහන්සේ ස්වර්ගීය පූපය ඔවුනට දෙවා
වදාළ සේක.
**සියළුදෙනා** : සෑම ප්‍රමෝදයම එහි අඩංගු වී ඇත්තේ ය.

## යාච්ඤා කරම්හ

තමන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සිහිවීම මේ ආශ්වයයාමත් වූ දේව ප්‍රසාද නිධානය ස්ථාපනය කළා වූ දෙවියනි, ඔබවහන්සේගේ ගැළවීමේ පල නිතර අප කෙරෙහි දැනෙන ලෙස ඔබ වහන්සේගේ ශරීරය රුධිරයෙනි ශුඬවූ අභිරහස් වලට ගෞරවය සහ වන්දනාව කරන පිණිස අපට කරුණා කළ මැනව.

මේ කීදේ සදහටම වැඩ සිටින්නාවූ ද, රජකම් කරන්නාවූ ද ඔබ වහන්සේගෙන්ම අපට ලැබේවා. ආමෙන්.

අශීර්වාදිත වේවා.

## දේව ප්‍රශංසා

දෙවියන් වහන්සේ,

ඔවුන් වහන්සේගේ ශ්‍රී නාමය,

සැබෑවූ දෙවියන් වහන්සේ ද, සැබෑවූ මනුෂ්‍යාද වන

ජේසුස් ක්‍රිස්තුස් ස්වාමි දරුවෝ,

ජේසුස් ස්වාමිදරුවන්ගේ ශ්‍රී නාමය,

ඔවුන් වහන්සේගේ ශ්‍රී හෘදය,

ඔවුන් වහන්සේගේ ශ්‍රී රුධිරය,

පුජාසනයෙහි දේව ප්‍රසාධ නිධානයෙහි ජේසුස් ස්වාමිදරුවෝ,

සැනසිලිකාරයාණන් වන ස්ප්‍රීතු සාන්තු වහන්සේ,

උත්තම දේව මාතාවන්වූ අති ශුද්ධවූ මරිම වහන්සේ,

ඔවුන් වහන්සේගේ නිර්මල පිළිසිඳීම,

ඔවුන් වහන්සේගේ ප්‍රතාපවත් ස්වර්ගාරෝපනය,

කන්‍යා මාතාවන්ගේ මරිය යන ශ්‍රී නාමය,

ඔවුන් වහන්සේගේ ව්‍රත ශුඬවත් පතිවූ ශුඬවූ ජුසේ තුමා,

දෙවියන් වහන්සේ තමන් දූතයන් හා ශුද්ධවන්තයන් කෙරෙහි,

අශීර්වාදිත වේවා.

# දිව්‍ය සත්ප්‍රසාදීය ගීතිකා

## දිව්‍ය ශ්‍රී පූපෙනී

දිව්‍ය ශ්‍රී පූපෙනී මුවා වූ දේවනේ
ඔබ සැම දිනේ වඳිමු ප්‍රේමිනේ

දෙව් මිනිස් ලෙදා ඔබ වැඳ සදා
පසු තැවුණු සොරා යැදී සේ මම යදිම්

## වඳිමු බිමට පහත් වී

වඳිමු බිමට පහත් වී සත්ප්‍රසාද නිදහනේ
සිරිත් නවමු ගිවිසුමේ රැකේ පැරැණි පහවැයේ
ඉඳුරු පටලයේ අඩුව පිරිමසා
එළිය ඇදැහියේ සිත පහදන්නේ

පියෙණි පුතුණි දෙවිඳුනේ ඔබ ඇසිරින් නික්මෙනා
සුදත් සුරිඳු දෙවියනේ ගැයේ ඔබට පසස ගී
මහිම තෙදනිමා නැති බුහුමන්නේ
දිනුම් ඔහොයියා ආසිරි අත්වේ

## නිත්‍ය ස්තුතියට

නිත්‍ය ස්තුතියට යෝග්‍ය වූ
දිව්‍ය සත්ප්‍රසාද වහන්ස
සදාකාලයටම වන්දනා නමස්කාර
ආරාධනා අත් වේවා

## ස්වර්ගයෙන්

ස්වර්ගයෙන් පහළ වූ ජේසුනී
ජීවන දායක පූපෙනී
නිරතුරු අපි ඔබට
වැඳ නමස්කාර කරමු //

# දේව මාතාවන්ට ගීතිකා

## මරිය රැජිණියේ

මරිය රැජිණියේ මා දයාබර මවේ
දුබල අපට සැම දා සරණ වන මවේ

මවක ලෙසින් දරු අපගේ අවැසි තා බලා
ඒ සැම අපට නිති ලැබ දෙන දයාබර මවේ//

බැගෑ ලෙසින් අප වෙනුවෙන් දෙව් තුම හමුවේ
මැදහත් වන අප ආදර දයාබර මවේ//

කරුණාබර ඔබ දෙනෙතම අප වෙත යොමවා
අප දුක සැප බලන අපේ දයාබර මවේ//

## පාතිමාවේ මෑණියෝ

පාතිමාවේ මෑණියෝ//
අප කුමාරී දේව දරී
කන්නි නාරී මව් මරී

හිරු පබා පා ඔබ නමා - තේජ මාතා පාතිමා
රෝස වස්වා ආස දිස්වා -හිරු පබා පා ඔබ නමා

යදින සේ කී පා සමා - ලෝක මාතා පාතිමා
රෝස වස්වා ආස දිස්වා - දෙන්නැ ඉල්ලා පා සමා

ඔබ හදේ මාතා පෙමා - අප කෙරේ පා පාතිමා
රෝස වස්වා ආස දිස්වා - අප රකිත්වා පාතිමා

## නමෝ නමෝ ගීතේ

නමෝ නමෝ ගීතේ
ස්වර්ග ලෝකේ මිහිරේ
භූලෝ වාසින් සැමා
වන්දනාවේ වස්වා
නමෝ - නමෝ නමෝ මරියේ //

නිර්දෝෂ මරියේ
හෘද අප ඔබේ
ශ්‍රී පාදේ වඳිමු
රකිනු දරුන් ඔබේ
නමෝ - නමෝ නමෝ මරියේ //

# දේව මාතාවන්ගේ ප්‍රතිමාවෙන් ආශිර්වාද කිරීම

ජම්ම දොෂයෙන් නිර්දෝෂව පිළිසිඳු මරියනී, ඔබ වහන්සේගේ පිහිට උපකාර ඉල්ලා සිටින්නා වූ අප උදෙසා යාච්ඤා කරනවා සොදේ

## මරිය තුමියගේ උදාන ගීය

**පූර්ව වගන්තිය :**

අරුණෙමෙන් නැගී චන්ද්‍රයා මෙන් අලංකාරවද සූර්‍ය්‍යයාමෙන් දීප්තිමත්ව ද යුඬයට සැරසුන සේනාවක් මෙන් බලසම්පන්නව ද වඩින මේ උත්තමාව කව්ද?

1. මා ආත්මය තෙම ස්වාමීන් වහන්සේට ස්තෝත්‍ර කෙරේ.
2. මාගේ චිත්තය ද මාගේ ගැළවුම්කාර වූ දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රීතිමත් විය.
3. මක්නිසාද ඔවුන් වහන්සේ ස්වකීය දාසිගේ බැගෑපත්කම සැලකු සේක. එහෙයින් බලව, මෙතැන් පටන් සකල පරම්පරාවෝ මට භාග්‍ය වන්තීයයි කියන්නෝ ය.

4. මක්නිසාද, බලවත්වූ ඔවුන් වහන්සේ මට මහත් දේවල් කළ සේක. ඔවූන් වහන්සේගේ නාමය ශුද්ධ ය.

5. ඔවුන් වහන්සේගේ කරුණාව ඔවුන් වහන්සේට භය වෙන්නවුන් කෙරෙහි සියලුම පරම්පරාවලට පවතින්නේ ය.

6. ඔවුන් වහන්සේ තමන් වහන්සේගේ බාහු බලය දැක්වූ සේක. අහංකාරයින් තමන්ගේ සිත්වල කල්පනා විසිරෙව් සේක.

7. ඔවුන් වහන්සේ බලවන්තයින් ඔවුන්ගේ ආසනවලින් පහත් හෙලා බැගෑපත් අප උසස් කළ සේක.

8. ඔවුන් වහන්සේ බඩසාවුවන් යහපත් දෙයින් පුරවා ධනවතුන් හිස් අතින් හැරිය සේක.

9. ඔවුන් වහන්සේ අපේ පියවරුන්වූ ආබ්‍රහම්ට සහ ඔවුගේ වංශයට සදහටම වදාළ පරිදි

10. ඔවුන් වහන්සේ අනුකම්පා සිත් ඇතිව තමන් වහන්සේගේ දාසවූ ඊශ්‍රායෙල් පිළිගත් සේක.

පිතා පුත්‍රයා ස්ප්‍රීතු සාන්තු නම් ත්‍රිත්ව එක දේවෝත්තමයාණන් වහන්සේට ස්තෝත්‍ර වේවා. ආදි වූවාක්මෙන් දැනුත් නිතිපතත් අනන්ත කාලයක් වේවා - ආමෙන්.

**පූර්ව වගන්තිය :**

අරුණාමෙන් නැගී චන්ද්‍රයා මෙන් අලංකාරවද සූර්‍යයාමෙන් දීප්තිමත්ව ද යුධයට සැරසුන සේනාවක් මෙන් බලසම්පන්නව ද වඩින මේ උත්තමාව කව්ද?

ප්‍ර - ජම්ම දොෂයෙන් නිර්දෝෂව පිළිසිඳු මරියනී,
උ - ඔබ වහන්සේගේ පිහිට උපකාර ඉල්ලා සිටින්නා වූ අප උදෙසා යාච්ඤා කළ මැනව.

## අපි යාච්ඤා කරමු

ඔබ වහන්සේගේ මෑණියන්වූ කන්‍යා මරියෝත්තමාව අපගේ මෑණියන් ද ඔබ වහන්සේ ඉදිරියේ අපගේ මධ්‍යස්ථය ද කොට දෙන්ට කරුණා අභිප්‍රාය වූවා වූ ද දෙව් පියාණන් ඉදිරියේ අප මධ්‍යස්තකයාණන් වූ ද, ජේසුස් ස්වාමි දරුවන් වහන්ස, ඔබ වහන්සේගේ පිහිට ඉල්ලා ඔබ වහන්සේ වෙත පැමිණෙන්නන් විසින් ඉල්ලනු ලබන වරප්‍රසාද සියල්ල එතුමියගේ මාර්ගයෙන් ලැබීමට කරුණාවෙන් සැලැස්සුව මැනව. ආමෙන්.

# මරිය තුමියගේ නිර්මල හෘදයට කැපකිරිම

මරියතුමීගේ නිර්මල හෘදයෙනි, ස්වර්ගයේත් ප්‍රථිවියේත් රාජේශ්වරියනි, දයාවන්ත මාතාවෙනි, අප සියලු දෙනාවම ඔබ නිර්මල හෘදයට කැප කරන්නෙමු. ඔබතුමී අප සියලු දෙනා නිර්මල හෘදය තුළ තබා රක්ෂා කළ මැනව. අහෝ ජේසු සමිඳුන්ගේ දිව්‍ය හෘදයේ ද රාජිණියෙනි, අපේ සියලු විපත්වලදී අප ඔබට අයිති වන පිණිස අප මත රජකම් කළ මැනව. අහෝ නිර්මල හෘදයෙනි, කන්‍යාවන්ගේ රැජිණියෙනි,ශුද්ධතාවය නැමැති ජල දහරෙනි, අපේ අපරාධවලට වන්දි ගෙවීමටත් ඔබගේ නිර්මල හෘදයට සැනසීම දෙන්නටත් ඔබගේ ගුණ ධර්ම අනුසාර කිරීමටත් අපි දැන් කැමැත්තෙමු. ඒ නිසා දවස්පතා ජපමාලය ඔප්පු කිරිමටත් ශුද්ධවූ සත්ප්‍රසාද වහන්සේ ලබාගන්නටත් ඒ සමඟම අපි පරිත්‍යාගයේ වන්දි ගෙවීමේ හා පසුතැවිලි වීමේ ක්‍රියා ඔප්පු කිරීමටත් අධිෂ්ඨාන කර ගනිමු. ආමෙන්.